# ගිණුම්කරණය

## අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය සඳහා විෂයානුබද්ධ සංචිතය

## 06

## කේවල ස්වාමි ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරයි - බහුවරණ සහ කෙටි ප්‍රශ්න

1) ව්‍යාපාරයක 2020.03.31 දින සිදු වූ ජල ගැලීමකින් ගබඩාවේ තිබූ තොගයෙන් ¾ ක් විනාශ විය. 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු සපයා ඇත.

| විස්තරය | (රු'000) |
|---|---:|
| විකුණුම් | 15,000 |
| ගැණුම් | 6,000 |
| ආපසු එවුම් | 750 |
| විකුණුම් පිරිවැය | 8,000 |

තොග හානිය සම්බන්ධයෙන් 80% ක් ගෙවීමට රක්ෂණ සමාගම එකඟ විය. මෙම සිදුවීම සම්බන්ධයෙන් ව්‍යාපාරයට සිදු වූ ශුද්ධ අලාභය රු. 150,000 කි. විනාශ වූ තොගයේ පිරිවැය කොපමණද ?

(1) රු. 150,000
(2) රු. 250,000
(3) රු. 750,000
(4) රු. 800,000
(5) රු. 1,000,000

2) ව්‍යාපාරයක අඩමාණ ණය සඳහා වෙන් කිරීම සම්බන්ධයෙන් පහත තොරතුරු දී ඇත.

| | 2020/12/31 | 2019/12/31 |
|---|---|---|
| අඩමාණ ණය සඳහා වෙන් කිරීම | 70,000 | 50,000 |

- 2020.06.10 දින රු. 80000 ක ණයගැතියෙකු බුන්වත් වූ බව දැන ගන්නට ලැබුනි.
- බොල් හා අඩමාණ ණය වෙන් කිරීම එකම ගිණුමක් මඟින් සිදු කරයි නම්,

ආදායම් ප්‍රකාශනයේ බෙදා හැරීමේ වියදම යටතේ දැක්විය යුතු වටිනාකම කොපමණද ?

(1) රු. 50,000
(2) රු. 70,000
(3) රු. 80,000
(4) රු. 100,000
(5) රු. 120,000

3) ව්‍යාපාරයක් 2020 ජනවාරි මාසය තුල ගෙවන ලද ශුද්ධ වැටුප රු. 135,000 කි. සේවක අර්ථසාධක අරමුදලට සේවක දායකත්වය (EPF) 10 % ක් වන අතර සේවා දායකය 15% කි. ETF දායකය 3% කි.

පහත ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

1. ව්‍යාපාරයේ දළ වැටුප් වියදම කොපමණද ?
2. ව්‍යාපාරයේ 2020 ජනවාරි මාසයට අදාල EPF හා ETF වියදම වෙන වෙනම දක්වන්න.
   EPF :
   ETF :
3. ජනවාරි මාසය අවසානයේ එක් එක් වගකීම දක්වන්න.
   (මාසික EPF හා ETF වියදම ඊට පසුව එන මාසයේදී ගෙවනු ලබයි.)
   ගෙවිය යුතු EPF :
   ගෙවිය යුතු ETF :

- ප්‍රශ්න අංක 4 සහ 5 සඳහා පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිතා කරන්න.

ලහිරුගේ ව්‍යාපාරයේ ආදායම් හා වියදම් සම්බන්ධ පහත තොරතුරු ඔබ වෙත දී ඇත.

| | 2019.04.01 | 2020.04.01 |
|---|---|---|
| කලින් ලද කුලී ආදායම | 2,000 | ? |
| ගෙවිය යුතු විදුලිය | 2,000 | 1,500 |
| ඉදිරියට ගෙවූ රක්ෂණ වියදම් | 1,000 | 500 |
| උපචිත දුරකථන ගාස්තු | 200 | - |
| කලින් ගෙවූ දුරකතන ගාස්තු | - | 100 |

2020.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා දුරකතන ගාස්තු වියදම රු.9,700 ක් හා කුලී ආදායම රු.15,000 ක් වේ.

| | | |
|---|---|---|
| වර්ෂය තුල ගෙවූ වියදම් | විදුලිය | රු. 8,000 |
| | රක්ෂණ | රු. 12,000 |
| | දුරකතන | රු. ? |
| වර්ෂය තුල ලද කුලී ආදායම | | රු. 14,000 |

4) 2020.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විදුලි වියදම හා රක්ෂණ ගාස්තුව කොපමණද ?

| | විදුලි වියදම (රු) | රක්ෂණ ගාස්තු (රු) |
|---|---|---|
| (1) | 4,500 | 1,500 |
| (2) | 4,500 | 12,500 |
| (3) | 7,500 | 12,500 |
| (4) | 7,500 | 13,500 |
| (5) | 8,500 | 13,500 |



වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව

5) වර්ෂය තුල මුදලින් ගෙවූ දුරකතන ගාස්තුව සහ 2020.03.31 දිනට කලින් ලද කුලී ආදායම කොපමණද ?

| | ගෙවූ දුරකතන ගාස්තු (රු) | කලින් ලද කුලී ආදායම (රු) |
|---|---|---|
| (1) | 9,400 | 2,000 |
| (2) | 9,600 | 1,000 |
| (3) | 9,600 | 3,000 |
| (4) | 10,000 | 1,000 |
| (5) | 10,000 | 2,000 |

- ප්‍රශ්න අංක 6, 7 සහ 8 ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිතා කරන්න.

එකතු කල අගය මත බදු (VAT) සඳහා ලියාපදිංචි ව්‍යාපාරයක 2020.03.31 දිනෙන් අවසන් වර්ෂයට අදාළ පහත ගණුදෙනු ඔබ වෙත දී ඇත.

| | රු. |
|---|---|
| ණයට විකුණුම් ( 15% VAT සහිත) | 287,500 |
| ණයට ගැණුම් ( 15% VAT සහිත) | 92,000 |
| අත්පිට ගැණුම් ( 15% VAT රහිත) | 150,000 |
| ණයට ගැණුම් ආපසු යැවුම් ( 15% VAT සහිත) | 11,500 |
| වර්ෂය තුළ ගෙවූ VAT | 10,000 |

ව්‍යාපාරයේ වත්කම් සහ වගකීම් කිහිපයක් පහත දැක්වේ.

| | 2019.04.01 | 2020.03.31 |
|---|---|---|
| ණයගැති | 30,000 | 40,000 |
| ණයහිමි | 15,000 | 18,000 |
| තොගය | 10,000 | 20,000 |
| ගෙවිය යුතු VAT | 12,000 | ? |

පිරිවැයට 10 % ක ලාභයක් සහිතව භාණ්ඩ විකිණීම ව්‍යාපාරයේ ප්‍රතිපත්තිය වේ.

6) ව්‍යාපාරයේ දළ ලාභය කොපමණද ?
   (1) රු. 40,000
   (2) රු. 41,500
   (3) රු. 64,000
   (4) රු. 65,500
   (5) රු. 77,500

7) VAT පාලන ගිණුමේ 2020.03.31 දිනට ශේෂය කොපමණද ?
   (1) හර 2,500
   (2) හර 5,500
   (3) බැර 6,500
   (4) බැර 9,000
   (5) බැර 10,550



වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව

8) ඉහත දැක්වෙන ආපසු යැවුම් වලට අදාල ද්විත්ව සටහන දක්වන්න. (සංලක්ෂය අවශ්‍ය නොවේ).

9) සුමුදු පාසල් ලිපිද්‍රව්‍ය අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යයි. විකිණීමේ හෝ ආපසු එවීමේ පදනමට ජනිත් වෙත යවන ලද තොගයේ විකුණුම් මිල රු. 82,500 කි. මෙම තොගයේ ආපසු එවීමේ කාලය ඉකුත් වී නැති අතර 2020.03.31 දින වන විට ඉන් ¼ ක් විකිණී නොමැති බව දන්වා එවා ඇත. පිරිවැයට 10 % ක ලාභයක් සහිතව භාණ්ඩ විකිණීම සුමුදුගේ ප්‍රතිපත්තිය වන අතර මේ සම්බන්ධව සිහිවටන සටහනක් පමණක් තබා ඇත.
සුමුදුගේ ව්‍යාපාරයේ කෙටුම්පත් දළ ලාභය පහත පරිදි දක්වා ඇත.

| | | රු. |
|---|---|---|
| විකුණුම් | | 250,000 |
| ආරම්භක තොගය | 12,000 | |
| ගැණුම් | 185,000 | |
| (-) තොග | (8,000) | (189,000) |
| දළ ලාභය | | 61,000 |
| | | ======= |

ඉහත ගැලපීමෙන් පසු පහත දෑ දක්වන්න.

1. විකුණුම් වටිනාකම කොපමණද ? ....................................
2. අවසන් තොගයේ පිරිවැය කොපමණද ? ...............................
3. ඉහත විකුණන ලද තොගයට අදාල ද්විත්ව සටහන ? ..............................

10) චතුරගේ ව්‍යාපාරයේ දේපල පිරියත හා උපකරණ සම්බන්ධයෙන් පහත තොරතුරු ඔබ වෙත දී ඇත.

| වත්කම | 2019.04.01 දිනට පිරිවැය | සමුච්චිත ක්ෂය | වර්ෂය තුළ මිලට ගැනුම් (මිලට ගත් දිනය හා වටිනාකම) | ක්ෂය ප්‍රතිපත්තිය |
|---|---|---|---|---|
| ඉඩම් | 500,000 | - | - | - |
| ගොඩනැගිලි | 200,000 | 50,000 | - | සරල මාර්ග ක්‍රමයට 10 % |
| මෝටර් රථ | 300,000 | 30,000 | - | හීනවන ශේෂ ක්‍රමයට 5% |
| යන්ත්‍ර | 100,000 | 20,000 | 2019.04.01 දින රු.50,000 | සරල මාර්ග ක්‍රමයට 20 % |
| පරිගණක | - | - | 2019.10.01 දින රු. 80,000 | සරල මාර්ග ක්‍රමයට 10 % |
| ලී බඩු | 50,000 | 10,000 | 2019.12.01 දින රු.100,000 | සරල මාර්ග ක්‍රමයට 10 % |

1. 2020.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා දේපල පිරියත හා උපකරණ ක්ෂය ගණනය කරන්න.

ගොඩනැගිලි - ......................................
යන්ත්‍ර - ......................................
මෝටර් රථ - .......................................
පරිගණක - .....................................
ලී බඩු - .....................................

වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව

2. චතුරගේ ව්‍යාපාරයේ දේපල පිරියත හා උපකරණ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන උදෘතයන්ට අදාළ පහත හිස්තැන් සම්පූර්ණ කරන්න.

------------------------------------------------ A
------------------------------------------------ B

| ජංගම නොවන වත්කම් | පිරිවැය | සමුච්චිත ක්ෂය | ශුද්ධ අගය |
|---|---|---|---|
| දේපල පිරියත හා උපකරණ | | | |
| ඉඩම් | C | I | O |
| ගොඩනැගිලි | D | J | P |
| මෝටර් රථ | E | K | Q |
| යන්ත්‍ර | F | L | R |
| ලී බඩු | G | M | S |
| පරිගණක | H | N | T |
| | | | U |

11) පහත තොරතුරු තනි පුද්ගල ව්‍යාපාරයක් වන සිරිදු ගේ ව්‍යාපාරයට අදාල වේ.

2021.03.31 දිනට; මුළු වත්කම් රු. 3,485,000
මුළු වගකීම් රු. 2,135,000
2020.04.01 දිනට , මුළු හිමිකම රු. 750,000
2021.03.31 දිනෙන් අවසන් වර්ෂය තුල දී රු. 150,000 ක ගැනිලි සිදු කර ඇති අතර අමතර ප්‍රාග්ධනය ලෙස රු.300,000 ක් යොදවා ඇත.

පහත දෑ ගණනය කරන්න.

1. 2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභය, රු.........................
2. 2021.03.31 දිනට මුළු හිමිකම රු. ...........................

12) ලක්සිරි ව්‍යාපාරය 2017.04.01 දින රු.800,000 කට යන්ත්‍රයක් මිලට ගන්නා ලදි. මෙදිනට එහි ඵලදායී ජීව කාලය හා සුන්බුන් අගය පිළිවෙලින් වසර 6ක් සහ රු. 80,000 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. 2020.04.01 දින මෙම යන්ත්‍රය රු. 600,000 ක් වේ නම් යන්ත්‍ර විකිණීම නිසා සිදු වූ ලාභය හෝ අලාභය කොපමණද ?

13) පහත වැරදි හේතුවෙන් ව්‍යාපාරයේ ලාභය අඩුවේද / වැඩිවේද / වෙනස් නොවේ ද යන්න දක්වන්න.

1. අයිතිකරුගේ භාණ්ඩ ගැනිලි, ගැනිලි ගිණුමේ සටහන් කර නැත.
2. කලින් ගෙවූ විදුලි වියදමත් වර්ෂයේ වියදමක් ලෙස වාර්තා කිරීම.
3. ලැබිය යුතු කුලී ආදායම පොත් වල වාර්තා කර නැත.
4. ගෙවිය යුතු රක්ෂණ වියදමක් පොත් වල වාර්තා කර නැත.

# ගිණුම්කරණය

## අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය සඳහා විෂයානුබද්ධ සංචිතය

## 06 කේවල ස්වාමි ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරයි - ව්‍යුහගත ප්‍රශ්න

01) සේනාධීරගේ ව්‍යාපාරයේ 2021/03/31 දිනෙන් වර්ෂය සඳහා පහත ශේෂ පිරික්සුම දී ඇත.

| | රු’000 | |
|---|---|---|
| ණයගැති හා ණයහිමි | 3,500 | 2,750 |
| ආයෝජන ආදායම් | | 300 |
| ආයෝජන | 4,500 | |
| ගැනුම් හා විකුණුම් | 11,000 | 24,000 |
| දුන් වට්ටම් හා ලද වට්ටම් | 150 | 300 |
| කොමිස් | 550 | 350 |
| වැටුප් (ශුද්ධ) | 2,700 | |
| ගෙන ඒමේ කුලී | 750 | |
| දුරකතන ගාස්තු | 550 | |
| බැංකු ගාස්තු | 150 | |
| පොලිය | 200 | |
| ස්ථාවර තැන්පතු | 6,000 | |
| ආයෝජන | 4,000 | |
| බැංකු ණය | | 8,000 |
| ප්‍රාග්ධනය | | 30,000 |
| තොගය 2020.04.01 | 550 | |
| ඉඩම් | 4,000 | |
| ගොඩනැගිලි | 5,000 | |
| රථවාහන | 4,000 | |
| කාර්යාල උපකරණ | 3,000 | |
| යන්ත්‍ර | 2,000 | |
| විදුලිය ගාස්තු | 300 | |
| ප්‍රචාරණ වියදම් | 450 | |
| තීරු බදු | 100 | |
| ගැනිලි | 50 | |
| උපචිත විදුලිය 2020/04/01 | | 200 |
| අඩමාණ ණය වෙන් කිරීම | | 450 |
| බොල්ණය | 150 | |

| | | |
|---|---|---|
| **ක්ෂය වෙන් කිරීම** | | |
| ගොඩනැගිලි | | 1,000 |
| රථවාහන | | 1,500 |
| යන්ත්‍ර | | 500 |
| කාර්යාල උපකරණ | | 500 |
| බැංකු | 16,200 | |
| | **69,850** | **69,850** |

අතිරේක තොරතුරු

i. 2021.03.31 දිනට තොගයේ පිරිවැය රු. 850,000 වන අතර එහි ශුද්ධ උපලබ්ධි අගය රු. 950,000 වේ.

ii. විකිණීමේ හෝ ආපසු එවීමේ පදනමට යවන ලද පිරිවැය රු. 1,500,000 වූ භාණ්ඩ තොගයකින් අඩක් පමණක් විකිණී ඇති බව 2021/03/31 වන විට දන්වා තිබෙන අතර එහි විකුණුම් මිල ලකුණු කර ඇත්තේ පිරිවැයට 20% ක් වන ලෙසය. මෙය ණයට විකුණුම් ලෙස ගිණුම් ගත කර ඇත.

iii. ජංගම නොවන වත්කම් පහත පරිදි ක්ෂය කල යුතු අතර ප්‍රවර්ථන වර්ෂයට ක්ෂය කර නැත.
   a. ගොඩනැගිලි පිරිවැයට 10 %
   b. කාර්යාල උපකරණ පිරිවැයට 10 %
   c. යන්ත්‍ර පිරිවැයට 10 %
   d. රථවාහන හීනවන ශේෂයට 10 %

iv. රු. 200,000 ක් බොල්ණය ලෙස කපාහැර ඉතිරි ණයගැතියන්ගෙන් 10% ක් ලෙස අඩමාන ණය වෙන් කරන්න.

v. දළ වැටුප මත EPF හා ETF ගෙවිය යුතුය. සේවක අර්ථසාධක අරමුදලට සේවකයාගෙන් 10% ක් ද සේව්‍යයාගෙන් 15% ක් ද ලෙස ගෙවිය යුතුය. සේවක භාරකාර අරමුදල 3%.

අවශ්‍ය වන්නේ,

1) 2021.03.31 දිනෙන් අවසන් වර්ෂය ආදායම් ප්‍රකාශය
2) එදිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව

02) වීරසිංහගේ ව්‍යාපාරයේ 2021/03/31 දිනට ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| | රු. '000 | |
|---|---|---|
| විස්තරය | හර | බැර |
| ගැනුම් හා විකුණුම් | 2,300 | 7,720 |
| ප්‍රාග්ධනය | | 18,000 |
| ණයගැති හා ණයහිමි | 250 | 150 |
| දුන් වට්ටම් හා ලද වට්ටම් | 30 | 100 |
| ජංගම නොවන වත්කම් - ධාරණ අගය (2020.04.01) | 21,600 | |
| ගෙනඒමේ කුලී | 45 | |
| 5% ආයෝජන | 1,000 | |
| 12% ස්ථාවර තැන්පතු | 2,000 | |
| වැටුප් (ශුද්ධ) | 1,800 | |
| 2020.04.01 තොගය | 700 | |
| විදුලිය | 150 | |
| තීරු බදු | 50 | |
| ප්‍රචාරණය | 130 | |
| බොල්ණය | 75 | |
| අඩමාණ ණය වෙන් කිරීම 2020.04.01 | | 170 |
| බැංකු ණය | | 5,000 |
| බැංකු ණය පොලී | 50 | |
| ගෙන යාමේ කුලී | 70 | |
| ආයෝජන ආදායම් | | 100 |
| බැංකු | 990 | |
| | 31,240 | 31,240 |

අතිරේක තොරතුරු

i. 2021.03.31 දිනට අවසන් තොගය රු. 900,000 ක පිරිවැය අගයක් පෙන් වූ අතර එහි ශුද්ධ උපලබ්ධි අගය රු. 720,000කි.

ii. දළ වැටුප මත සේවක අර්ථසාධක අරමුදල (EPF) සඳහා සේව්‍ය දායකය 15% ක් වන අතර සේවක දායකය 10 % වේ. සේවක භාරකාර අරමුදල (ETF) සඳහා සේව්‍ය දායකය 3% කි. EPF සේවක දායකය අඩු කර ගෙන වැටුප් ගෙවා ඇත.

iii. ජංගම නොවන වත්කම් වල 2020/04/01 දිනට සාරාංශය මෙසේය.

| | පිරිවැය | සමුච්චිත ක්ෂය | ධාරණ අගය (රු'000) |
|---|---|---|---|
| ඉඩම් | 8,000 | - | 8,000 |
| ගොඩනැගිලි | 6,000 | 1,200 | 4,800 |
| යන්ත්‍ර | 4,000 | 800 | 3,200 |
| මෝටර් රථ | 7,000 | 1,400 | 5,600 |
| | | | 21,600 |

වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව

iv. සියළු වත්කම් 2019.04.01 දින මිලදී ගෙන ඇති අතර ප්‍රවර්තන වර්ෂය සඳහා ක්ෂය කර නොමැත.

v. 2021.03.31 දිනට උපචිත වියදම්
   a. විදුලිය 100,000
   b. ප්‍රචාරණය 50,000

vi. ණයගැතියන්ගෙන් 50% ක් ලෙස අඩමාණ ණය ගැලපිය යුතුයි.

අවශ්‍ය වන්නේ,
1) 2021.03.31දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය
2) එදිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය.

වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව